**කාන්තා කාර්යාංශය, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සහ සමෘද්ධි බැංකුව සහ ප්‍රතිලාභියා වන .........................................මයා/මිය අතර ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ආධාර ලබාගැනීම සඳහා වන ගිවිසුම**

එක් පක්ෂයකට, එකී පක්ෂය පද සම්බන්ධය අනුව අවකාශ ලැබෙන තන්හි පළමු පාර්ශ්වයයැයි හඳුන්වනු ලබන හෝ අදහස් කරනු ලබන, ඇය/ඔහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිය සමාජවාදී ජනරජයේ **{ප්‍රතිලාභියාගේ ලිපිනය ඇතුලත් කරන්න}** ලිපිනයෙහි හි පදිංචි **{ප්‍රතිලාභියාගේ හැඳුනුම්පත් අංකය ඇතුලත් කරන්න}** හැඳුනුම්පත් අංකය හිමි **{ප්‍රතිලාභියාගේ නම ඇතුලත් කරන්න}** මයා/මිය (මින්මතු පළමු පාර්ශ්වය යැයි හඳුන්වනු ලබන) සහ දෙවන පක්ෂයට, පද සම්බන්ධය අනුව අවකාශ ලැබෙන තන්හි දෙවන පාර්ශ්වයයැයි හඳුන්වනු ලබන හෝ අදහස් කරනු ලබන, **කාන්තා කාර්යාංශය, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය** සහ අවශ්‍ය ඕනෑම තැනක සහ ඕනෑම අවස්ථාවක නිල බලය අනුව එහි අනුප්‍රාප්තිකයෙකු ද (මින්මතු දෙවන පාර්ශ්වය යැයි හඳුන්වනු ලබන) සහ තෙවන පක්ෂයට, පද සම්බන්ධය අනුව අවකාශ ලැබෙන තන්හි තුන්වන පාර්ශ්වයයැයි හඳුන්වනු ලබන හෝ අදහස් කරනු ලබන, **{සමෘද්ධි බැංකු ශාඛාවේ නම ඇතුලත් කරන්න}** සහ අවශ්‍ය ඕනෑම තැනක සහ ඕනෑම අවස්ථාවක නිල බලය අනුව එහි අනුප්‍රාප්තිකයෙකු ද (මින්මතු තුන්වන පාර්ශ්වය යැයි හඳුන්වනු ලබන) යන අයවලුන් අතර මෙම ගිවිසුම සකස්කර **වර්ෂ දෙදහස් විසිතුනක් වූ නොවැම්බර් මස විසිවන වන (2023.11..20)** දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රීය සමාජවාදී ජනරජයේ **{සමෘද්ධි බැංකු ශාඛාවේ නම ඇතුලත් කරන්න}** දී ගිවිසුමට එළඹ ඊට සාක්ෂි වශයෙන්:

## සාක්ෂි

මෙහි අ උපලේඛනයේ වැඩිදුරටත් සම්පූර්ණයෙන් විස්තර කර ඇති ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන හදිසි ආධාර ව්‍යාපෘතිය (FSLREAP) යටතේ ලබා දෙන ජීවනෝපාය සංවර්ධනය සඳහා වන මූල්‍ය ආධාරවලින් ලැබෙන ආධාරයෙහි නීත්‍යානුකූල හිමිකරු වන්නේ ඉහත කී පළමු පාර්ශවය වේ.

මෙම ගිවිසුම එහි පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය ගිවිසුම් ඇති කර ගත් සහ පාර්ශවයන් අතර සහ එකඟ වූ පහත කරුණු වලට සාක්ෂි වශයෙන්,

1. එකී FSLREAP යටතේ ඔහුගේඇයගේ ජීවනෝපාය නඟා සිටුවීමේ එකම අරමුණ සඳහා පළමු / පාර්ශවයට ජීවනෝපාය සංවර්ධනයවෙනුවෙන් එම මූල්‍ය ආධාර ලබා දේ.

2. පළමු පාර්ශ්වය විසින් 2024 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර අ උපලේඛනයේ විස්තර කර ඇති පරිදි එම කාර්යය සඳහා ජීවනෝපාය සංවර්ධනය සඳහා ලබා දී ඇති මූල්‍ය ආධාර සම්පූර්ණයෙන්ම භාවිතා කළ යුතු අතර එසේ නොවනේන් නම් නියමිත කාලය විධිමත් ලෙස දීර්ඝ නොකරන ලදහොත් අරමුදල් ආපසු ලබාගනු ලැබේ.
3. “අ” උපලේඛනයේ විස්තර කර ඇති හඳුනාගත් උපකරණ / මෙවලම් සඳහා දෙවන පාර්ශවය තෙවන පාර්ශවය හරහා පළමු පාර්ශවයට මුදල් සැපයිය යුතුය.
4. පළමු පාර්ශවයට උපකරණ / මෙවලම් ලබාදීම සඳහා තෝරාගෙන ඇති සැපයුම්කරුවන්ට අරමුදල් නිදහස් කිරීම සඳහා තෙවන පාර්ශ්වය විසින් ඒ බැව් තහවුරු කිරීමේ ලිපියක් සැපයිය යුතුය.
5. පළමු පාර්ශවයේ අවශ්‍යතාවයට අනුකූලව බාරදීම් අවසන් වූ පසු දෙවන පාර්ශවය විසින් ජීවනෝපාය සංවර්ධනය සඳහා ඔහුගේ/ඇයගේ ගිණුමට බැර කරන ලද මුදල සැපයුම්කරුගේ ගිණුමට මුදා හැරීමට පළමු පාර්ශවයට මෙයින් අවසර දෙනු ලැබේ.
6. FSLREAP යටතේ පළමු පාර්ශ්වයට ලබා දී ඇති උපකරණ / මෙවලම් අවභාවිතා කිරීම හෝ කිසිදු ආකාරයක නීති විරෝධී කටයුත්තක් සඳහා යොදාගැනීම සිදු නොකළ යුතුය.
7. සපයා ඇති උපකරණ / මෙවලම් ඔහුගේ/ඇයගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා දිගටම භාවිතා කිරීම සහ ඒවා නිසි පරිදි නඩත්තු කිරීම පළමු පාර්ශවයේ යුතුකම වේ.
8. සැපයූ උපකරණ/මෙවලම්වලට කිසියම් සොරකමක් හෝ නැතිවීමක් හෝ හානියක් සිදුවුවහොත් ඒ බැව් දෙවන පාර්ශවයට වාර්තා කිරීම පළමු පාර්ශවයේ වගකීම වන්නේ ය.
9. පළමු පාර්ශවය විසින් ඔහුට/ඇයට ලබා දී ඇති උපකරණ / මෙවලම් විකිණීමට උත්සාහ කළහොත් හෝ ලබා දී ඇති ආධාර භාවිතා කිරීමේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කළහොත්, ලබා දී ඇති උපකරණ / මෙවලම් ඔවුන්ගෙන් නැවත ලබාගෙන FSLREAP යටතේ ජීවනෝපාය සංවර්ධනය සඳහා මූල්‍ය ආධාර සඳහා හිමිකම් ඇති වෙනත් තෝරාගත් ප්‍රතිලාභියෙකුට ඒවා භාර දීමට දෙවන පාර්ශ්වයට අයිතිය ඇත.
10. ආධාර අරපිරිමැස්මෙන් හා අප්‍රමාදීව භාවිතා කිරීම සහ අනාගතයේදී ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඉතිරිකිරීම් සිදු කිරීම පළමු පාර්ශ්වයේ වගකීම වන්නේ ය.
11. මෙම ගිවිසුමේ සපයා නොමැති නමුත් ඔවුන් අතර ඇති විය හැකි කුමන ආකාරයේ හෝ ගැටලු ඔවුන් අතර අන්‍යෝන්‍ය එකඟතාවයෙන් සහ කැමැත්තෙන් විසඳා ගත යුතු බවට සියළු පාර්ශවයන් මෙයින් එකඟ වේ.
12. ගිවිසුම සංශෝධනය කිරීම සහ/හෝ අතිරේකව නව විධිවිධාන ඇතුල්කිරීම සඳහා සියළු පාර්ශ්වයන් අනෙන්‍ය ලිඛිත ගිවිසුමට යටත් වේ.

**ඉහත කී ‘‘අ’’ උපලේඛනය**

1. ආධාරයේ ස්වභාවය පිළිබඳ තොරතුරු (දෙනලද උපකරණය/මෙවලම)

   අ.

   ආ.

   ඇ.

2. ආධාරය ලබාදීමේ අරමුණ

**...............................................මහතා/මහත්මිය වන මම පළමු පාර්වය සදහා සාක්ෂි ලෙස වර්ෂ දෙදහස් විසිතුනක් වූ නොවැම්බර් මස විසිවන වන (2023.11..20)** දින........................................................................................... **{සමෘද්ධි බැංකු ශාඛාවේ නම ඇතුලත් කරන්න}** හිදී මාගේ නිලමුද්‍රාව තබා අත්සන තබමි.

**............................................................**

**පළමු පාර්ශ්වයේ අත්සන**

(නම, තනතුර සහ නිල මුද්‍රාව)

........නිලධාරි**................................................... මහතා/මහත්මිය වන මම දෙවන පාර්වය සදහා සහ ඒ වෙනුවෙන් සාක්ෂි ලෙස වර්ෂ දෙදහස් විසිතුනක් වූ නොවැම්බර් මස විසිවන වන (2023.11..20)** දින........................................................................................... **{අදාල දෙපාර්තමේන්තුවේ නම ඇතුලත් කරන්න}** හිදී මාගේ නිලමුද්‍රාව තබා අත්සන තබමි.

**............................................................**

**දෙවන පාර්ශ්වයේ අත්සන**

(නම, තනතුර සහ නිල මුද්‍රාව)

කළමණාකාර.................................................. **මහතා/මහත්මිය වන මම තෙවන පාර්වය සඳහා සහ ඒ වෙනුවෙන් සාක්ෂි ලෙස වර්ෂ දෙදහස් විසිතුනක් වූ නොවැම්බර් මස විසිවන වන (2023.11..20)** දින.......................................................................................... { **සමෘද්ධි බැංකු ශාඛාවේ නම ඇතුලත් කරන්න**} හිදී මාගේ නිලමුද්‍රාව තබා අත්සන තබමි.

**.............................................................**

**දෙවන පාර්ශ්වයේ අත්සන**

(නම, තනතුර සහ නිල මුද්‍රාව)

**සාක්ෂි**

..................................................... (සම්පූර්ණ නම, තනතුරු සහ ලිපිනය)